**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**External Degrees and Extension Courses Unit**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**University of Sri Jayewardenepura**


| | | | |
|---|---|---|---|
| මගේඅංකය My Number | USJP/EEX13 /2025 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10,Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka, |
| ඔබේඅංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-2801481,011-3132496 | වෙබ්අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | | විද්‍යුත් තැපැල E-mail | info.ext@sjp.ac.lk |


2025-10-31

ප්‍රිය ශිෂ්‍ය/ ශිෂ්‍යාවනි,

## 2024/2025 විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම - 2025

01. ඉහත පරීක්ෂණයට අයදුම් කිරීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

| | |
|---|---|
| **පරීක්ෂණ අයදුම්පත ලබා ගැනීම** | ඔබගේ තොරතුරු ගොනුව **(Student Profile)** වෙත පිවිස **Examination** හි ඇති **Application** වෙත පිවිස අයදුම්පත ලබා ගත හැකිය. |
| **අයදුම්පත් යොමු කිරීම** | ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස ලබා ගන්නා අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කළ (Apply) යුතු වේ. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් යොමු කළ (Apply) පසු ඔබ ඉල්ලුම් කළ පරීක්ෂණයට අදාළ තොරතුරු Student Profile හරහා පරීක්ෂා කළ හැකිය. |
| **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** | **2025 නොවැම්බර් 17 (රාත්‍රී 12.00 දක්වා)** |

02. <u>සැලකිය යුතුයි</u>

I. පරීක්ෂණ අයදුම්පත් යොමු කිරීමට **ප්‍රථම පාඨමාලා ගාස්තු දෙවන වාරිකය ගෙවා සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ.** එසේ ගෙවා නොමැති අයදුම්පත් නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. අයදුම්පත් යොමු කිරීමේ අවසන් දිනය **2025 නොවැම්බර් 17 (රාත්‍රී 12.00 දක්වා)** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

III. විදේශ ගත සිසුන් සඳහා විභාග අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පරීක්ෂණ (EDECU Online Distance Supervision Examinations) සඳහා පෙනී සිටිය හැකි වේ. ඒ සම්බන්ධයෙන් විස්තර http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/ වෙත පිවිසීමෙන් ලබාගත හැකි වේ.

IV. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියලු දැනුවත් කිරීම් වෙබ් අඩවිය/ ශිෂ්‍ය තොරතුරු ගොනුව **(Student Profile)** හරහා පමණක් සිදුවේ.

V. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශ පත්‍රය ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) **වෙත පිවිස** Examination **හි ඇති** Admission **වෙත පිවිස බාගත** (Download) **හැකිය.** විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.

VI. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/ B.Sc. Business Studies (General) External Degree/ Examinations/ Rules and Regulations** වෙත පිවිස පරිශීලනය කල හැක.

VII. උපාධියක් සම්පූර්ණ කිරීම **:** උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ශිෂ්‍ය අත්පොත **(Student Handbook)** පරිශීලනය කිරීමෙන් ලබා ගත හැකිය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම**

- රෝගී තත්ත්වයේ ස්වරූපය මත, අසනීප නිසා මුළු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාගය ආරම්භ වීමට අවම වශයෙන් **විනාඩි තිහකට පෙර** විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී වෙත වාර්තා කළ යුතු ය. ඊට අදාළ වෛද්‍ය සහතිකය පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමඟ තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-10-31